# තිරසර සංවර්ධන හා වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා 2018-03-23 දින පළ වූ පුවත්පත් දැන්වීමෙහි අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2018-04-10 දින ලෙස සඳහන් කර තිබූ අතර,එය 2018-10-30 දින දක්වා දීර්ඝ කර ඇත. ඒ අනුව සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | පුරප්පාඩු ගණන |
|---|---|
| බංගලා භාරකරු | 12 |
| සහකාර බංගලා භාරකරු | 06 |
| බෝට්ටු ක්‍රියාකරු | 10 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 07 |
| ක්ෂේත්‍ර සහයක | 42 |

02. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් 2018.10.30. දිනට පෙර **වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයේ අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවට ද, 10 සිට 15 තෙක් දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

| තනතුරු නාමය | සුදුසුකම්, වැටුප් පරිමාණ හා බඳවා ගැනීමේ ක්‍රමය | පැවරෙන කාර්ය භාරය |
|---|---|---|
| බංගලා භාරකරු | ➢ **වැටුප් පරිමාණය** :<br>මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක 1 උපලේඛනය අනුව PL2 - 2016 වැටුප් කේතය යටතේ වන රු. 25,250 - 10 X 270 - 10 X 300 -10 X 330 - 12 X 350 - 38,450 /= වැටුප් පරිමාණය වේ.<br>➢ **අධ්‍යාපන සුදුසුකම්** :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම<br>➢ **වෘත්තීය සුදුසුකම්** :<br>ජාතික ආධුනිකත්ව මණ්ඩලය හෝ ලංකා සංචාරක මණ්ඩලය හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන සූපවේදය හෝ සංචාරක නිවාස නඩත්තුව පිළිබඳ N.V.Q. දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හා පෙරදිග හා අපරදිග ක්‍රම දෙකෙන්ම ආහාර පිළියෙළ කිරීමේ හැකියාව හා ඉංග්‍රීසි කථා කිරීමේ හැකියාව තිබීම.<br>➢ **පළපුරුද්ද** :<br>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක්. පිළිගත් ආයතනයකින් ලබා තිබීම. (අදාළ පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය)<br>➢ **බඳවා ගැනීමේ ක්‍රමය** :<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 1:5 අනුපාතයට ප්‍රායෝගික හා ව්‍යුහගත පරීක්ෂණ යන දෙකෙන්ම ලබාගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩුවලට බඳවා ගැනීම කරනු ලැබේ. | 1. සංචාරක බංගලා වලට පැමිණෙන අමුත්තන් සුහදව පිළිගැනීම, සංග්‍රහ කිරීම, ඔවුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම, කෑම පිළියෙල කර දීම, ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව වගකීමෙන් යුතුව කටයුතු කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.<br>2. සංචාරක බංගලාව සහ උද්‍යානය පිරිසිදුව සහ අලංකාරව පවත්වාගෙන යාම<br>3. සංචාරක බංගලාව නිසි පරිදි නඩත්තු කිරීම හා එහි සුරක්ෂිතභාවය පවත්වාගෙන යාම<br>4. සංචාරක බංගලාවෙහි පවතින ද්‍රව්‍ය හා උපකරණ ලැයිස්තු නිසි පරිදි පවත්වාගෙන යාම<br>5. දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් පවරනු ලබන තනතුරට අදාළ වෙනත් රාජකාරී කටයුතු ඉටු කිරීම. |
| සහකාර බංගලා භාරකරු | ➢ **වැටුප් පරිමාණය** :<br>මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක 1 උපලේඛන අනුව PL1 - 2016 වැටුප් කේතය යටතේ වන රු.24,250 - 10X250 - 10 X 270 - 10 X 300 - 12X330- රු.36,410 /= වැටුප් පරිමාණය වේ.<br>➢ **අධ්‍යාපන සුදුසුකම්** :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව සමත් වී තිබීම.<br>➢ **වෘත්තීය සුදුසුකම්** :<br>ජාතික ආධුනිකත්ව මණ්ඩලය හෝ ලංකා සංචාරක මණ්ඩලය හෝ වෙනත් පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන සූපවේදය හෝ සංචාරක නිවාස නඩත්තුව පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හා පෙරදිග හා අපරදිග ක්‍රම දෙකෙන්ම ආහාර පිළියෙළ කිරීමේ හැකියාව තිබිය යුතුය.<br>➢ **පළපුරුද්ද** :<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.<br>➢ **බඳවා ගැනීමේ ක්‍රමය** :<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබා ගන්නා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 1:5 අනුපාතයට ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවා පරීක්ෂණ දෙකෙන්ම ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ. | 1. සංචාරක බංගලා වලට පැමිණෙන අමුත්තන් සඳහා කෑම පිළියෙල කර දීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.<br>2. සංචාරක බංගලාවල වැසිකිළි, නැසිකිළි ආදිය නිසි පරිදි පවත්වා ගෙන යාම, සංචාරක බංගලාවල ඇතුළත හා පිටත පවිත්‍රව තබා ගැනීම.<br>3. බංගලා භාරකරුට අවශ්‍ය සහාය ලබා දීම.<br>4. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව විටින් විට පැවරෙන වෙනත් රාජකාරී. |
| බෝට්ටු ක්‍රියාකරු | ➢ **වැටුප් පරිමාණය** :<br>මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03 / 2016 හි අංක 1 උපලේඛනය අනුව PL2 -2016 වැටුප් කේතය යටතේ වන රු.25,250- 10X270 - 10 X 330- 12X350 - රු.38,450 /= වැටුප් පරිමාණය වේ.<br>➢ **අධ්‍යාපන සුදුසුකම්** :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්වී තිබීම.<br>➢ **වෘත්තීය සුදුසුකම්** :<br>ජාතික වෘත්තීය කුසලතාවන්හි N.V.Q. අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබාගෙන තිබීම.<br>බෝට්ටු ක්‍රියාකරවීම සම්බන්ධයෙන් පිළිගත් ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.<br>➢ **පළපුරුද්ද** :<br>විශේෂ සුදුසුකමක් සේ සැලකේ.<br>➢ **බඳවා ගැනීමේ ක්‍රමය** :<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුව 1:3 අනුපාතයට වෘත්තීය පරීක්ෂණයට කැඳවා එහිදී ලබාගන්නා ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී වූ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ. (බඳවා ගන්නා සියලුම බෝට්ටු ක්‍රියාකරුවන් සඳහා සතියක පුහුණුවක් නාවික හමුදාවේ සහායෙන් ලබාදීමට අපේක්ෂිතය ) | 1. දෙපාර්තමේන්තුවේ සමුද්‍රීය හා ජලජ පද්ධති ආශ්‍රිතව පවතින ජාතික උද්‍යාන හා අභයභූමි තුළ මුර සංචාරක කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා සහාය දීම.<br>2. කලපු ආශ්‍රිතව හා සමුද්‍රීය පද්ධති ආශ්‍රිතව සිදුවන නීති විරෝධී ක්‍රියා වළක්වාලීම සඳහා මුර සංචාරක කටයුතු සඳහා සහාය දීම.<br>3. අභයභූමි තුළ පවතින වැව් හා ජලාශ ආශ්‍රිතව සිදුවන සංචාරක කටයුතු සහ නීති විරෝධී ක්‍රියා වළක්වාලීමේ කටයුතු සඳහා අවශ්‍ය බෝට්ටු ධාවන කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම.<br>4. සමුද්‍රීය හා ජලජ පද්ධති ආශ්‍රිතව පවතින අභයභූමිවල වනජීවී සංරක්ෂණය හා කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය සහාය දීම.<br>5. වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරට අදාළව පවරන ලද වෙනත් රාජකාරී |
| යන්ත්‍ර ක්‍රියාකරු | ➢ **වැටුප් පරිමාණය** :<br>මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක 1 උපලේඛන අනුව PL2 - 2016 වැටුප් කේතය යටතේ වන රු.25,250 - 10 X 270 - 10 X 300 - 10 X 330 - 12X350- රු.38,450 /= වැටුප් පරිමාණය වේ.<br>➢ **අධ්‍යාපන සුදුසුකම්** :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්වී තිබීම.<br>➢ **වෘත්තීය සුදුසුකම්** :<br>ජාතික වෘත්තීය කුසලතාවන්හි N.V.Q. අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබාගෙන තිබීම.පහත සඳහන් යන්ත්‍ර අතුරෙන් අඩුම වශයෙන් යන්ත්‍ර දෙකක් ක්‍රියා කරවීමට හා නඩත්තු කිරීමේ නිපුණතාවයක් තිබීම.<br>i. ඩෝසර්<br>ii. ද්‍රවබල එක්ස්කැවේටර්<br>iii. වීල් ලෝඩර්<br>iv. ලෝඩර් බැකෝ<br>v. මෝටර් ග්‍රේඩර්<br>vi. රෝලර්.<br>බර වාහන පැදවීමේ වසර 05 ක් පැරණි බලපත්‍රයක් ලබා තිබීම.<br>➢ **පළපුරුද්ද** : විශේෂ සුදුසුකමක් සේ සැලකේ.<br>➢ **බඳවා ගැනීමේ ක්‍රමය** :<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට බඳවාගනු ලැබේ. | 1. සර්විස් කිරීම හා වැරදි සොයා ගැනීම ඇතුළුව යන්ත්‍ර ක්‍රියාකරවීම සහ ආරක්ෂා කර තබා ගැනීම.<br>2. පස් අදින උපකරණ හා යන්ත්‍ර කාර්යක්ෂම ලෙස ක්‍රියාකරවීම.<br>3. විශේෂ ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ අදාළ යන්ත්‍ර භාවිතා කිරීම.<br>4. පස බුරුල් කිරීමට, පස් කැපීමට, පැටවීමට, තල්ලු කිරීමට හා ඇදීමට භාවිත කරනු ලබන උපකරණ නිසි පරිදි ක්‍රියාකරවීම.<br>5. වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරන ලද වෙනත් රාජකාරී. |

| | | |
|---|---|---|
| **ක්ෂේත්‍ර සහයක** | ➢ **වැටුප් පරිමාණය** :<br>මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක 1 උපලේඛන අනුව PL1 - 2016 වැටුප් කේතය යටතේ වන රු.24,250 - 10X250 - 10 X 270 - 10 X 300 - 12X330- රු.36,410 /= වැටුප් පරිමාණය වේ.<br>➢ **අධ්‍යාපන සුදුසුකම්** :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව සමත් වී තිබීම.<br>➢ **පළපුරුද්ද** :<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.<br>➢ **බඳවා ගැනීමේ ක්‍රමය** :<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගෙන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ. | 1. දෙපාර්තමේන්තුවට අයත් ක්ෂේත්‍ර කාර්යාලවල වනෝද්‍යාන හා රක්ෂිත ප්‍රදේශ වලට අදාළ සියලු ක්ෂේත්‍ර සහායක රාජකාරි<br>2. වන සතුන් රැකබලා ගැනීමේ කාර්යයන්ට අයත් ක්ෂේත්‍ර සහායක රාජකාරි<br>3. වන සතුන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම, විදුලි වැට නඩත්තු කිරීමේ කටයුතු ආදියට අයත් ක්ෂේත්‍ර සහායක රාජකාරි.<br>4. වනගත ප්‍රදේශවල සිටින අලි ඇතුන් අල්ලා ඉවත් කිරීම අලි පලවා හැරීම ආදී මෙහෙයුම් සඳහා වන ක්ෂේත්‍ර සහායක රාජකාරි<br>5. ඉහත සඳහන් රාජකාරිවලට අයත් නොවන දෙපාර්තමේන්තුවට අයත් දෛනික ක්ෂේත්‍ර සහායක රාජකාරි<br>6. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව පැවරෙන වෙනත් රාජකාරි |

**03. සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනන්දරු / වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

**04. වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.

**05. කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**06. වෙනත්** :

i. ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. බංගලා භාරකරු , සහකාර බංගලා භාරකරු, යන්ත්‍ර ක්‍රියාකරු, බෝට්ටු ක්‍රියාකරු යන තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් පමණක් විය යුතු අතර, ක්ෂේත්‍ර සහායක යන තනතුර සඳහා කාන්තා හා පිරිමි යන දෙපාර්ශවයටම ඉල්ලුම් කළ හැක.

**07. සම්මුඛ පරීක්ෂණය :**

❋ වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත.

❋ මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වුවහොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

**08.** මෙම නිවේදනය සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සකස් කරන ලද ඉල්ලුම්පත් 2018.10.30 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතන අංශයට භාර දිය යුතුය.

**එම්.ජී.සී. සූරියබණ්ඩාර**
**අධ්‍යක්ෂ ජනරාල්**

## ආදර්ශ අයදුම්පත්‍රය

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ .................................... තනතුර සඳහා බඳවා ගැනීම.**

1. (අ) අයදුම්කරුගේ නම මුලකුරු සමග
   (1) සිංහලෙන් / දෙමළෙන් :
   ..........................................................................................
   (2) ඉංග්‍රීසියෙන්
   ..........................................................................................
2. ස්ථිර ලිපිනය :-
   (1) සිංහලෙන් / දෙමළෙන් :
   ..........................................................................................
   (2) ඉංග්‍රීසියෙන් :
   ..........................................................................................
3. දුරකථන අංකය : ..........................................
4. ස්ත්‍රී / පුරුෂ භාවය : ..........................................
5. (අ) උපන් දිනය : ..........................................
   (ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු : .................. මාස : .................. දින : ..................
6. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................
7. විවාහක / අවිවාහක බව : ..........................................
8. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන බව : ..........................................
9. අධ්‍යාපන සුදුසුකම් : (සාමාන්‍ය පෙළ ප්‍රතිඵල)

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

10. (අ) බෝට්ටු පැදවීමේ බලපත්‍රයේ / බරවාහන පැදවීමේ බලපත්‍රයේ අංකය හා නිකුත් කළ දිනය
    (අදාළ සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය)
    ..........................................................................................
11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් (අදාළ සහතිකවල පිටපත් අමුණන්න) :
    ..........................................................................................
    ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
    ..........................................................................................
12. දැනට රැකියාවක නියුක්තව ඇත්නම් ඒ පිළිබඳව විස්තර :
    ..........................................................................................
13. **අයදුම්කරුගේ ප්‍රකාශය :**
    මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද සියලුම තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් අසත්‍ය තොරතුරු දක්වා ඇති බව පත්වීම් ලබා දීමට පෙර අනාවරණය වුවහොත් මාගේ පත්වීම අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය : .............................. අත්සන : ..............................

14. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්කරු මා හොඳින් දන්නා හඳුනන අයෙකු බවත්, ඔහු අද දින මා ඉදිරිපිටදී මෙහි සුපුරුදු අත්සන තබන ලද බවත්, මෙම අත්සන ඔහුගේ බවත් සහතික කරමි.

(රජයේ විදුහලක විදුහල්පතිවරයකු, නීතිඥවරයෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයකු, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයකු හෝ රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අපේක්ෂක /අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.)

..........................................
අත්සන සහතික කරන අයගේ අත්සන හා නිල මුද්‍රාව